## ඒෂියන් ග්‍රැමර් පාසල
## පළමු වාර පරීක්ෂණය - 2017
## 09 ශ්‍රේණිය
## සිංහල භාෂාව හා සාහිත්‍යය

කාලය පැය 2 1/2

නම :-......................................................................

සැකසුම :- පි.එන්.බී.එන්.දයාරත්න          පන්තිය :-.....................................

## I පත්‍රය

*ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න*

**හිස්තැනට සුදුසු පදය තොරන්න**

1. කුමාරතුංග මුනිදාස මහතා මෙරට සිටි ....................ලේඛකයෙකි

   I පරම  II දක්ෂ  III විශිෂ්ට  IV කරුණාවන්ත

2. අනගාරික ධර්මපාලතුමාගේ පරම ......................වුයේ බුදුදහම දියුණු කිරීමයි

   I හැදියාව  II හැකියාව  III අභිලාෂය  IV දියුණුව

**නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරන්න**

3. I පරිගණකය  II පරිඝනකය  III පරිගනකය  IV පරිඝණකය

4. I පුස්තකාලය  II පුස්ටකාලය  III පුශ්තකාලය  IV පුස්ටඛාලය

5. **මහප්‍රාණ** අක්ෂරයක් සහිත වචනය තෝරන්න.

   I කඳ  II ප්‍රතිඵල  III පිපුණු  IV ප්‍රශංසාව

6. **පතළ** යන පදයට සමාන පදයක් වන්නේ

   I සුළඟ  II වාතය  III ප්‍රසිද්ධ  IV මැණික් පතල

7. යුගල පදයක් නොවන පදය තෝරන්න

   I විදුරුබෝතල්  II භරකාබාන  III කෙළිසෙල්ලම්  IV ගේදොර

**හිස්තැනට සුදුසු පදය යොදන්න**

8. ගහට .......................කැපුවා වගෙයි

9. පරංගියා .........................ගියා වගෙයි

10. පහත දැක්වෙන **රූඪි** පද සම්පූර්ණ කරන්න

    I ලැල්ලට ...............................

    II ඉහේ ...............................

**හිස්තැනට සුදුසු අවසාන ක්‍රියා පදය ලියන්න**

11. මම පාසලට ..............................
12. ඔවුහු නිවසේ වැඩ ..............................
13. නිළියෝ ප්‍රේක්ෂකයන් ..............................
14. ගුරුතුමා අපට ..............................

**ඉරි ඇඳි කොටසේ අර්ථයට වඩාත් සමීප පිළිතුර තෝරන්න**

15. රෝගියාට දුන් බෙහෙත **<u>සිකුරටම හරියන බව</u>** වෛද්‍යවරයා පැවසුවේය.

I සිකුරු ග්‍රහයාට ගැළපෙන ලෙස
II රෝගියාට වරදින බව
III කිසි ලෙසකින් නොවරදින බව
IV සිකුරාදාට සුව වන බව

16. අපගේ නිවස තැරව්කරු **<u>කුණු කොල්ලයට</u>** ඉල්ලා සිටියේය.

I වැඩි මිලකට
II ණයට
III පහසු ගෙවීමේ ක්‍රමයට
IV ඉතා අඩු මිලකට

17. පහත යුගල පදය සම්පූර්ණ කරන්න
අනම් ..............................

හිස්තැනට සුදුසු අකුර යොදන්න

18. ප්‍රදර් ................නය (ශ, ෂ)
19. දුම්රිය පො ..................(ල, ළ)
20. [illegible]........ [illegible] (ත, ට)

(ල · 1 x 20 = 20)

Copyright @ Asian Grammar School

## II පත්‍රය

***1 හා 2 ප්‍රශ්න ඇතුළුව තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න***

01. පන්ති කාමරයේදී ඔබට ලැබුණු දේශාභිමානි ගීත ක්‍රියාකාරකම ඇසුරෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

I. ඔබට ලැබුණු දේශාභිමානි ගීත වල මුල් පද පේළි දෙක ලියා එහි ගායකයා හා රචකයා සඳහන් කරන්න

II. ක්‍රියාකාරකමෙහි නිරත වීමට පෙර ඔබට ලැබුණු ගුරු උපදෙස් තුනක් ලියන්න

III. ගුරු උපදෙස් වලට අමතරව කණ්ඩායමේ සාමාජිකයින් ඉදිරිපත් කල යෝජනා මොනවාද?

IV. දේශාභිමානි ගීත වලින් ඔබ උගත් දේවල් 03ක් සඳහන් කරන්න

V. මෙම ක්‍රියාකාරකමෙහි යෙදීමේදී ඔබට ඇතිවූ ගැටළු මොනවාද?

(ල.15)

02. පහත මාතෘකා වලින් එකක් තෝරාගෙන වචන 200කට නොඅඩු රචනයක් ලියන්න

- නිදහසින් පසු ශ්‍රී ලංකාව
- අපේ මාතෘ භූමිය
- පරිසරය සුරකිමු

(ල.20)

03. ඔබ පාසලේ පැවති ක්‍රීඩා උත්සවය පිළිබඳව පුවත්පත් වාර්තාවක් සකසන්න

(ල.10)

04. පෙළපොත ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

I. මවුබිම යන්නට සමාන පද දෙකක් ලියන්න

II. **"යහපති, මහ රජතුමනි මට යාමට අවසර"**

- මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම කුමක්ද?
- මෙම ප්‍රකාශය කවුරු විසින් කා හට කියන ලද්දක්ද?

III **"එහෙනම් කොහොමද ඔය කවි ඉගෙනගෙන තියෙන්නේ"**

- කවුරු විසින් කාහට කියන ලද්දක්ද?
- ඔය කවි යනුවෙන් අදහස් කලේ කුමන කවි වලටද?

IV **"මේ ගමන යන්නේ කවදාදැයි"**

- කවුරු විසින් කාහට කියන ලද්දක්ද?
- මෙම ප්‍රකාශය ඇතුලත් පාඩමේ නම ලියන්න

V **"තාත්තට දැන් විවේකෙන් ඉන්න පුළුවන්"**

- මෙම කෙටිකතාව ලියූ ලේඛකයා කවුද?
- කවුරු විසින් කාහට කියන ලද්දක්ද?

(ල.10)

Copyright @ Asian S...

05. පහත පදවල අර්ථය ලියන්න

I. අඥාන ..........................................................
II. ආඥාව ..........................................................
III. සියපත ..........................................................
IV. පරිකල්පනය ..........................................................
V. අපා ..........................................................
VI. දේශාභිමානය ..........................................................
VII. තෙද ..........................................................
VIII. හරිත වර්ණය ..........................................................
IX. නුදු රකාණි
X. හුරා

06. හිස්තැන් පුරවන්න (ල.10)

I. ගංවතුර උවදුර........................පහවිය
II. අපි නුවර පෙරහැර බැලීම........................
III. ........................නංගි නැටුමක් නැටුවාය.
IV. අපි දේශනයට........................සවන් දුන්නෙමු.
V. ඔවුහු නගරයට........................
VI. නුඹලා නිතරම පන්සල්........................
VII. ගුරුතුමිය අකුරු........................
VIII. ........................පන්සල් යමි
IX. අම්මාද මමද නගරයට........................
X. ඉන්ජිනේරුවෝ පාලම........................

(සීඝ්‍රයෙන්, තනති, ගියෙමු, හොඳින්, ගියෙහු, මම, යමු, ගියහ, සුදු, උගන්වයි)

(ල.10)

07. පහත පැදිපෙළ කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

මහ මුහුදක් වැනි අම්මා
මහ මිහිකෙත වැනි අම්මා
හිරු මෙන් පායා අම්මා
සඳ මෙන් බබළන අම්මා

මුහුදක කිරි දුන් අම්මා
මිහිකෙත දුක් දැරූ අම්මා
රන් සමනොළ ගිරි මුදුනේ
සිරිපා පද්මය අම්මා

I. මෙම පද්‍යයෙන් කියවෙන්නේ කවුරුන් ගැනද?
II. මෙහි දැක්වෙන උපමා දෙකක් ලියන්න
III. සමාන පද ලියන්න

මුහුද........................ පොළව ........................

IV සමනොළ ගිර යනු කුමක්ද?

(ල.10)